PR/2019/1S

ජපන් ජනතාවගෙනි
ஜப்பானிய மக்களிடமிருந்து
From the People of Japan


**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ශ්‍රීමත් ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව

දුරකථනය (+94-11-2693831~3, ෆැක්ස් (+94-11-2698629)

ඊමේල්: cultujpn@co.mofa.go.jp


**පුවත්පත් නිවේදනය**

2019 ජනවාරි මස 10 වන දින

**ජපානයේ සහයෝගයෙන් කෑගල්ලේ පාසලක පහසුකම් වැඩිදියුණු කෙරේ**

ජපන් රජයේ බිම් මට්ටමේ මානව ආරක්ෂණය සඳහා වන ආධාර ව්‍යාපාතිය (GGP) යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ හල්ඹලුව කනිෂ්ට විද්‍යාලයෙහි පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 14ක් ලබාදීමට කටයුතු සිදුකෙරේ.යෝජිත ව්‍යාපාතිය යටතේ හල්ඹලුව කනිෂ්ට විද්‍යාලයෙහි ළමුන් සහ ගුරුවරුන් සඳහා අවශ්‍ය අධ්‍යාපනික සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ. තනිමහල් පන්තිකාමර ගොඩනැගිල්ලක්, ඒ සඳහා අවශ්‍ය මේස සහ පුටු මෙන්ම විද්‍යාලයට නව ප්‍රවේශ මාර්ගයක්, ක්‍රීඩා පිටියක් සහ ජලය බෙදාහැරීමේ පද්ධතියක්ද මේ ව්‍යාපාතිය යටතේ ලබාදීමට නියමිත වේ. එතුලින් සිසු දරුදැරියන්ට අධ්‍යාපනය ලබාගැනීමට ඇති අවස්ථා වැඩි කෙරේ.

ව්‍යාපාතියට අදාල ගිවිසුමට අත්සන් තැබීම 2019.01.10 දින ශ්‍රී ලංකාවේ ජපන් තානාපති අකිරා සුගියාමා මහතා සහ හල්ඹලුව විද්‍යාලයේ විදුහල්පතිනි , P.W.G.M.N. වල්පොළ මහත්මිය විසින් හල්ඹලුව විද්‍යාලයේදී සිදුකරන ලදී.

මෙම ප්‍රදානය පිළිබඳව අදහස් දක්වමින් විද්‍යාලයේ විදුහල්පතිනිය වල්පොළ මහත්මිය කියා සිටියේ මෙම විද්‍යාලය කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීයව පිහිටා ඇති අතර අඩු ආදායම්ලාභී පවුල්වල දක්ෂ සිංහල සහ දෙමළ සිසු දරුදැරියන් රැසක් මෙම විද්‍යාලයේ ඉගෙනුම ලබන බවයි. දැනට විද්‍යාලයේ පවතිනා අඩු පහසුකම් හේතුවෙන් දරුවන්ට එළිමහනේ සිට අධ්‍යාපනය ලැබීමට  සිදු වී ඇති අතර වැසි දිනවලදී මෙන්ම දැඩි හිරු රශ්මිය සහිත දිනවලදීද ඉගෙනුම් කටයුතු වල යෙදීම ඉතා අපහසු බව පැවසිය.

පිරිසිදු ජලය හිඟවීම නිසා සිසුන් රෝගී වීම සමහර අවස්ථාවලදී දැකිය හැකි අතර ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කරගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රීඩා පිටියක් නොමැති වීම කණගාටුවට කරුණකි. එම නිසා අඩු පහසුකම් සහිත අප පාසල සංවර්ධනය සඳහා මෙවැනි ව්‍යාපාතියක් ලබාදීම වෙනුවෙන් ජපන් රජයට අපගේ කෘතවේදීත්වය පළකරමු. විද්‍යාලයේ

පහසුකම් වැඩි දියුණු වීමත් සමග සිසුන්ගේ පැමිණීම මෙන්ම නව සිසුන් බඳවා ගැනීම වැඩි කිරීමට අපට මෙමගින් හැකිවනු ඇත.

මේ පිළිබඳව හල්ඔලුව කනිෂ්ට විද්‍යාලයේ සිසු දරුදැරියන්, ආචාර්ය මණ්ඩලය, ආදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ගම්වැසියන් ඉතා සතුටට පත්වන අතර, මෙම ව්‍යාපෘතිය අප විද්‍යාලයට ලබාදීම පිළිබඳව ජපන් රජයට අපගේ ස්තූතිය පුද කරමු."


වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න

ජපන් තානාපති කාර්යාලයේ ආර්ථික සහයෝගිතා අංශය

දුරකථන අංක 011-2693831 දිගුව 225

ඊමේල් : cultujpn@co.mofa.go.jp